ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023-04-04

පැමිණිලි පාර්ශවය : එම්. උපසේන මයා.
නො 96/ඒ. උඩුමුල්ල.
පාදුක්ක.

ලකිල නිම්සර මාපටුන.
උඩුමුල්ල - පාදුක්ක.

අගතියට පත් පාර්ශවය

වගඋත්තරකාර පාර්ශවය : 01 විදුහල්පති.
මහින්ද රාජපක්ෂ විදුහල.
හෝමාගම.

02 නියෝජ්‍ය විදුහල්පති.
තේජා වීරක්කොඩි මිය.
මහින්ද රාජපක්ෂ විදුහල.
හෝමාගම.

<u>පැමිණිලි අංකය : HRC/2650/18</u>

**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම =:**

ඉහත පැමිණිලිකරු විසින් උක්ත පැමිණිලි අංකය යටතේ මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2018-10-31 දාතමින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, හෝමාගම මහින්ද රාජපක්ෂ විදුහලේ ඒ වනවිට අධ්‍යාපනය ලබමින් සිටි ලකිල නිම්සත් මාපටුන නමැති තම පුත්‍රයාට පාසලේ නියෝජ්‍ය විදුහල්පතිනිය වන තේජා වීරක්කොඩි මිය විසින් කම්මුලට අතින් පහර දී පසුව පන්ති තහනමට ලක් කිරීමට කටයුතු කර ඇති බවයි. එම පාසලේ උසස් පෙළ අධ්‍යාපනය ලබමින් සිටි තම




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

පුත්‍රයාගේ කොණ්ඩය කපා ඇති ආකාරයේ වරදක් ඇති බව පවසමින් උසස් පෙළ පන්තිභාර ආචාර්යවරිය දරුවාට මේ ආකාරයෙන් දඬුවම් ලබා දී ඇති බවත් දරුවා පාසල අවසන් වීමෙන් පසුව නිවසට පැමිණි පසු දෙමාපියන්ට මේ පිළිබඳව ප්‍රකාශ කිරීමෙන් පසු තමා පාසලට ගොස් මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරයා මුණ ගැසී කරුණු විමසූ බවත්, එහිදී විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පතිනිය ක්‍රියා කර ඇති ආකාරය සාධාරණීකරනය කරමින් කටයුතු කර ඇති බවත්, ඉන් පසුවද පාසලේ පවත්වා ඇති රැස්වීම් වලදීද මේ පිළිබඳව දරුවාට අගතියක් සිදුවන ආකාරයෙන් විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය කටයුතු කර ඇති බවත් මෙම සිද්ධියෙන් පසුව දරුවා එම පාසලේ තවදුරටත් අධ්‍යාපන කටයුතු සිදු කිරීම ප්‍රතික්ෂේප කරමින් සිටින බවත් ප්‍රකාශ කර ඇත. මෙම තත්වය තුළ තම දරුවා එම පාසලට නැවත අධ්‍යාපනය ලැබීමට යාම ප්‍රතික්ෂේප කරන බවද දක්වා ඇත.

ඒ අනුව,

01 තම දරුවාට වෙනත් ජාතික පාසලකට ඇතුලත් වීමට ඉඩකඩ සලසා දෙන ලෙසත්,

02 තම දරුවා කායික සහ මානසික හිංසනයට ලක් කරමින් කටයුතු කර ඇති නියෝජ්‍ය විදුහල්පතිනිය ඇතුළු වගඋත්තරකරුවන්ට එරෙහිව කටයුතු කර වන්දියක් අය කර දෙන ලෙසත්,

03 අදාළ නියෝජ්‍ය විදුහල්පතිනියට එරෙහිව නීතිමය සහ විනය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසත් මෙම පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයන්ගේ කරුණු දැක්වීම** =:

මෙම පැමිණිල්ලට අදාළව සිදුකරන ලද වැඩිදුර විමර්ශනය සඳහා නියෝජ්‍ය විදුහල්පති තේජා වීරක්කොඩි මිය, විදුහල්පතිවරයා වෙනුවෙන් නියෝජ්‍ය විදුහල්පති එල්.පී. උදාන මයා සහ පාසල වෙනුවෙන් තවත් නියෝජිතයින් දෙදෙනෙකු සහභාගි වී ඇත.

එහිදී නියෝජ්‍ය විදුහල්පතිනිය තේජා වීරක්කොඩි මිය ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ පුත්‍රයා තම පාසලේ උසස් පෙළ සිසුවෙකු ලෙස අධ්‍යාපනය ලබමින් සිටින බවත්, පාසලේ විනය කටයුතු පවත්වාගෙන යාමේදී මෙම දරුවා ආවේගශීලීව කටයුතු කිරීම නිසා කම්මුලට එක් පහරක් තමා විසින් එල්ල කළ බව සත්‍ය බවත්ය. එම දරුවා කොණ්ඩය කපා තිබූ ආකාරය පාසල් ශිෂ්‍යයෙකුට නොගැලපෙන නිසා නැවත කොණ්ඩය වැවෙන කල් පාසලට නොපැමිණෙන ලෙස අදාළ සිසුවාට උපදෙස් ලබා දුන් බවත්, නැවත පාසලට පැමිණෙන විට දෙමාපියන්ගෙන් ලිපියක් රැගෙන එන ලෙසද දරුවාට උපදෙස් ලබා දී ඇති බවත්, මෙම සිද්ධිය පිළිබඳව පසුව විදුහල්පතිවරයා සහ නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) ද දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවත් පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත. තවද එම සිද්ධියෙන් පසු දිනයේ පැමිණිලිකරු වන දරුවාගේ පියා පාසලට පැමිණ විදුහල්පතිවරයා, නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) සහ තමාද මුණ ගැසුනු බවත්, එහිදී දරුවාගේ පියා ආවේගශීලීව හැසිරෙමින් තම දරුවා මෙම පාසලෙන් ඉවත් කර ගන්නා බවට ප්‍රකාශ කර ඇති

බවත් පවසා ඇත. පත්ති තහනමක් සිදුව ඇති බවට ඉදිරිපත්ව ඇති චෝදනා සම්බන්ධයෙන් පිළිතුරු ලබාදෙමින් වගඋත්තරකරුවන් පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ, එවැනි පත්ති තහනමක් පනවා නොතිබූ බවත් දෙමාපියන්ගෙන් ලිපියක් රැගෙන නැවත පාසලට පැමිණෙන ලෙස පමණක් චෝදනා ලැබූ සිසුවාට උපදෙස් ලබා දී ඇති බවත්ය.

මෙම පරීක්ෂණය සඳහා විදුහල්පතිවරයා වෙනුවෙන් සහභාගි වී ඇති නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන) එල්.පී. උදාන මහතා පරීක්ෂණ නිලධාරී විසින් සිදුකර ඇති විමසීම් වලට පිළිතුරු ලෙස ප්‍රකාශ කර ඇත්තේ, මෙම සිද්ධියෙන් පසුව දරුවා තම පාසලේම තබා ගෙන අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යාමට විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනය උත්සාහ කළත් දරුවාගේ පියා ඊට තම අනුකූලතාවය පල නොකළ බවයි. කෙසේ වෙතත් ඒ වනවිට දරුවාට පහරදී ඇති බවට චෝදනා ලබා සිටි නියෝජ්‍ය විදුහල්පතිනිය උසස් පෙළ අංශයෙන් තාවකාලිකව ඉවත් කර වෙනත් නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු එම අංශයට පත් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත. නියෝජ්‍ය විදුහල්පති උදාන මහතා පරීක්ෂණ නිලධාරී සිදු කළ විමසීම් වලට ප්‍රතිචාර ලෙස ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරුගේ පුත්‍රයා තම පාසලේ තවදුරටත් අධ්‍යාපනය ලැබීමට කැමැත්ත පල කරන්නේ නම් දරුවාට කිසිදු අගතියක් සිදුවීමට ඉඩ නොතබා අනෙක් දරුවන් මෙන් නොවෙනස්ව අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සලසා දෙන බවත්ය.

**විමර්ශනය** =:

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී ප්‍රධාන වශයෙන්ම අවධානයට ලක්විය යුතු කාරණය ලෙස හැඳින්විය හැක්කේ දරුවාට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතියට බාධාවක් නොවීමට වගබලා ගැනීමයි. කෙසේ වෙතත් පැමිණිල්ලෙන් ප්‍රශ්නගත කාරණයට අදාළ සිද්ධියෙන් පසුව පැමිණිලිකරු විසින් තම දරුවා පාදුක්ක සිරිපියරතන විද්‍යාලයට ඇතුළත් කර අධ්‍යාපනය ලබමින් සිටින බව අනාවරණය වී ඇත. තවද දරුවා නැවත හෝමාගම මහින්ද රාජපක්ෂ විදුහලට ඇතුළත් කර අධ්‍යාපනය ලබාදීමට දරුවා මෙන්ම පියාද අකමැත්ත පල කර ඇති බව නිරීක්ෂණය වේ. සිය පැමිණිල්ල මගින් පැමිණිලිකරු ඉල්ලා ඇත්තේ, වෙනත් ජාතික පාසලකට හෝ විශේෂයෙන් කොළඹ ආනන්ද විදුහලට දරුවා ඇතුළත් කරදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසයි.

තාක්ෂණික විෂය ධාරාව යටතේ අපොස උ/පෙළ හදාරන තම දරුවා කොළඹ ආනන්ද විදුහලට ඇතුළත් කර ගැනීමට අයදුම් පත්‍රයක් යොමු කර ඇතත්, එම අවස්ථාව ආනන්ද විදුහල මගින් සිය දරුවාට ලබා දී නොමැති බව මෙම පැමිණිල්ල මගින් කරුණු ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් එච්ආර්සී/3033/18 අංකය යටතේ වෙනම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් පැමිණිල්ලට අදාළ වැඩිදුර විමර්ශනය සිදු කෙරෙන අතරතුර පැමිණිල්ල මගින් අගතියට පත් පාර්ශවය බව සඳහන් කර ඇති පැමිණිලිකරුගේ පුත්‍රයාගේ අධ්‍යාපන අයිතියට බාධාවක් නොමැතිව වෙනත් පාසලකට ඇතුළත්ව අධ්‍යාපනය ලබමින් සිටින බව තහවුරු වී ඇත.

මෙම පැමිණිල්ලට අදාළ වැඩිදුර විමර්ශනයේදී පැමිණිලිකරුගේ පුත්‍රයාට පහරදී කායික මෙන්ම මානසික හිංසනයට ලක්කර ඇති බව සඳහන් නියෝජ්‍ය විදුහල්පතිනිය විසින් දරුවාට කම්මුලට පහර දුන් බවට පිළිගෙන ඇත. (එක් වතාවක් කම්මුලට පහර දුන් බව) තවද දරුවාට පන්ති තහනමක් පැනවූ බවට වන චෝදනා ප්‍රතික්ෂේප කර ඇති වගඋත්තරකරුවන් මෙම දරුවාට නැවත තම පාසලට සුපුරුදු පරිදි පැමිණ අධ්‍යාපන කටයුතු සිදු කිරීමට බාධාවක් පාසල පාර්ශවයෙන් නොමැති බව ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත් පාසල තුළ විනය පවත්වාගෙන යාමට යම් පියවර ගැනීමට විදුහල්පතිවරයා ඇතුළු පාසල් පරිපාලනයට හැකියාව ඇතත්, සිසුන්ට කායික දඬුවම් පැමිණවීම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛය මගින්ම තහනම් කර ඇති තත්වයක් තුළ චෝදනා ලැබ ඇති නියෝජ්‍ය විදුහල්පතිනිය පැමිණිලිකරුගේ පුත්‍රයාට කම්මුලට පහර දුන් බව පිළිගැනීම මගින් ඉහත චක්‍රලේඛයේ ප්‍රතිපාදන උල්ලඝනය වන අයුරින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් මෙම සිද්ධියෙන් පසුව මෙම දරුවා රෝහලකට ඇතුළත්ව වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට කටයුතු කර ඇති බවට කරුණු අනාවරණය නොවේ. <u>කෙසේ වෙතත් වෙතත් සාක්ෂි මගින් තහවුරු නොවූවත් පැමිණිල්ලේ සඳහන් පරිදි සහ වැඩිදුර විමර්ශනයේදී අගතියට පත් පාර්ශවය සිදු කර ඇති වාචික කරුණු දැක්වීම් අනුවත් චෝදනාවන්ට ලක්ව ඇති නියෝජ්‍ය විදුහල්පතිනිය පරීක්ෂණයේදී පිළිගෙන ඇති පරිදි</u> පැමිණිලිකරුගේ පුත්‍රයාට කායික වධහිංසාවක් සිදුව ඇති බව තහවුරු වේ. පාසලේ විනය පවත්වාගෙන යාමට මේ ආකාරයෙන් දඬුවමක් සිදුකළ බවට වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇතත්, කායික දඬුවම් පැමිණවීම අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය මගින්ම තහනම් කර පැවතියදී සහ වෙනත් ආකාරයට දණ්ඩ නීති සංග්‍රහය මගින්ද වැළැක්වීමට පියවර ගෙන තිබියදී එසේ දඬුවම් පැමිණවීමක් සිදු කිරීම නීතියට පටහැනි වේ. මේ සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙතද පැමිණිලි කිරීමෙන් අනතුරුව එම ආයතන විසින්ද මේ සම්බන්ධව විමර්ශනයක් සිදු කර ඇති බව අනාවරණය වේ.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2016.04.29 දාතමින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛයේ 2.2.2 වගන්තිය අනුව "පාසල විසින් පිළිගත් චර්යාවන්ට නොගැලපෙන චර්යාවන් දක්වන සිසුන් නිවැරදි චර්යා රටාවන්ට හැඩගැස්සවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාසල් විනය මණ්ඩලයක් පිහිටුවිය යුතුය" යනුවෙන් සඳහන් කර ඇති අතර, එහි 2.3 වගන්තිය මගින් විනය මණ්ඩලයේ සංයුතියද, 2.3.1 මගින් සිසුන්ගේ අයතා හැසිරීමට අදාළ විනය මණ්ඩලයේ කාර්යභාරයද, 2.3.2 මගින් ශාරීරික දඬුවම් වෙනුවට විකල්ප ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වන වගන්ති සහ 2.4 මගින් පාසල් විනය පවත්වාගෙන යාමේ අරමුණින් වුවද සිසුන්ට දඬුවම් දීම කළහොත් අනුගමනය කළ හැකි නීති ක්‍රියාමාර්ග පිළිබඳව සඳහන් කර ඇත. ඒ අනුව මෙම ශිෂ්‍යා විනය විරෝධී හැසිරීමක් සිදුකර ඇති බව අනාවරණය වූ අවස්ථාවක ප්‍රධාන විනය මණ්ඩලයක් පත්කොට එම මණ්ඩලය ඉදිරියට පමුණුවා එහි තීරණය මත කටයුතු කළයුතු

බව ඉහත චක්‍රලේඛය පරිදි පෙන්වා දිය හැකි අතර නැවත කොන්ඩය කපන තෙක් පාසලට පැමිණිය නොහැකි බව විනය ක්‍රියාමාර්ගයක් ලෙස අනුගමනය කිරීමට හැකියාව තිබූ බව පෙන්වා දිය හැක. නමුත්, පාසල් පරිපාලනය එවැනි ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී නැති බව විමර්ශනයේදී අනාවරණය වී ඇත.

නිගමනය =:

මෙම පැමිණිල්ලට අදාළව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයෙන්ද පාර්ශවකරුවන් ඉදිපත් කර ඇති ලිඛිත සහ වාචික කරුණු දැක්වීම් අනුවද හෝමාගම මහින්ද රාජපක්ෂ විදුහලේ නියෝජ්‍ය විදුහල්පතිවරිය ලෙස කටයුතු කර ඇති තේජා වීරක්කොඩි මිය විසින් පැමිණිලිකරුගේ පුත්‍රයාට කායික වධ හිංසාවක් සිදුවන ආකාරයෙන් කටයුතු කර ඇති බවට ඇය විසින්ම ප්‍රකාශ කර පිළිගෙන ඇති බැවින් වගඋත්තරකාරිය සිය බලතල නීත්‍යානුකූල නොවන ආකාරයෙන් භාවිතා කොට ඇති බවත් එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවත්, මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ. මීට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2016.04.29 දාතමින් නිකුත් කර ඇති 12/2016 චක්‍රලේඛයේ ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවද නිගමනය කරමි.

මෙම පැමිණිල්ලේ විෂයගත කාරණය හා සමාන සිද්ධියක් සම්බන්ධයෙන් <u>හේවාමද්දුමගේ කරුණාපාල එදිරිව ජයන්ත ප්‍රේමකුමාර සිරිවර්ධන ඇතුළු පිරිස SC FR 97/2017 හා බණ්ඩාර එදිරිව වික්‍රමසිංහ **1995 SLR-167**</u> නඩුවේදී පැහැදිලිව දක්වා ඇත්තේ පාසල් ගුරු භවතුන්ට, අදාළ පාසලේ සිසුන්ගේ විනය පිළිබඳ වගකීමක් ඇති නමුත් ඒ සඳහා ඔවුන්ට ඇති බලතල ඉක්මවා කටයුතු කිරීම තුළින් මූලික අයිතිවාසිකම් කඩවීමක් අනාවරණය වන බවයි. ඒ අනුව මෙම සිද්ධියට අදාළව සිදුකර ඇති විමර්ශනයේදී වගඋත්තරකාර නියෝජ්‍ය විදුහල්පතිනිය වෙතින් වින්දිත සිසුවා සම්බන්ධව බලතල ඉක්මවා හා ඒ සඳහා නිකුත් කළ චක්‍රලේඛය වන 12/2016 චක්‍රලේඛය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වී ඇත.

නිර්දේශය =:

01. ඒ අනුව, වගඋත්තරකාර නියෝජ්‍ය විදුහල්පතිනිය විසින් අදාළ චක්‍රලේඛන උල්ලංඝනය කරමින් තම බලතල ඉක්මවා කටයුතු කිරීම තුළින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාව මගින් තහවුරු කරදී ඇති අගතියට පත් පැමිණිලිකරුගේ පුත්‍රයා වන ලකිල නිම්සර මාපටුන යන අයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින්. 02 වන වගඋත්තරකාර නියෝජ්‍ය විදුහල්පති. තේජා වීරක්කොඩි යන අයට අවවාද කිරීමට කටයුතු කළ යුතු බව ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. තවද, 12/2016 චක්‍රලේඛයට සම්බන්ධයෙන් සහ ඉදිරියේදී පාසල තුළ මෙවැනි තත්වයක් ඇති නොවීමට වගබලාගැනීම පිළිබඳව ගුරුවරුන් දැනුවත් කිරීමට සහ ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වාර්තා කිරීමට කටයුතු කළ යුතු බවට 1 වන වගඋත්තරකරු වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.05.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Ms. Anusuya Shanmuganathan**
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ආචාර්ය එම්.එච්. නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Dr. M.H. Nimal Karunasiri**
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත =: 01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/